# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2083/14 - 2018 අගෝස්තු මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**07 වැනි වගන්තිය යටතේ දැන්වීම**

*මගේ යොමු අංකය:-ව/18/09/2013.*
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:-4-3/7/2014/D/249.*

මහජන කටයුතක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම්/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය (1) උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

අත්කරගෙන ඇති ඉඩම් විස්තරය,

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලියවත්ත ගමේ පිහිටි මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක ගම්.4074 හා 2018.06.13 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0894 ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

01. **කැබලිඅංක 01**
ඉඩමේ නම: පල්ලියවත්ත; ඉඩම් විස්තරය: ගොඩනැගිලි සහිත ඉඩම; හිමිකම් පාන්නා: අංක 204,පල්ලියවත්ත පදිංචි කේ. බී. එල්. ඒ. අල්විස් සහ කේ. බී. ජේ. පී. ජයවර්ධන; මුල් හිමිකම් පාන්නා: -;ප්‍රමාණය: හෙක්ටයාර් 0.0894.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියාසිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවළුන් හෝ 2018 ඔක්තෝබර් මස 31 වැනි දින පූ.භා. 10.00ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2018 ඔක්තෝබර් මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරයත්, වන්දි මුදල හා එය ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

පී. ඩී. ටී. සී. රාජිකා,
ප්‍රාදේශීය ලේකම් ,
වත්තල.

2018 අගෝස්තු මස 04 වැනි දින,
වත්තල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

08-801



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනිපරිච්ඡේදය)**
**07 වැනි වගන්තිය යටතේ දැන්වීම**

*මගේ යොමු අංකය :* DS/VS/LB/ACQ/J-198/ 01.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාශයේ යොමු අංකය :* 4-3/7/2016/LO/374.

මහජන කටයුතක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම්/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/ පරවශතාවේ විස්තර,

මූලික පිඹුරු අංකයඃ යා 2902; ඉඩමඃ චුන්නාකම්; ග්‍රාමසේවා වසමඃ J/198 චුන්නාකම් නගරය මධ්‍යම; ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයඃ වලිකාමම් දකුණ, උඩුවිල්; දිස්ත්‍රික්කයඃ යාපනය; පළාතඃ උතුරු; හේතුවඃ චුන්නාකම් පොලිස් ස්ථානය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: උලකිතේරාපාඩමුම්, ආන්ඩිච්චි කුඩිජිරුප්පුම්, ආන්ඩියන් වලවුම්, ආන්ඩිච්චිකුඩිජිරුප්පුම් කිනට්ටඩියම්, පෙරියපුලමම්, මරුපිරිවුකලුම්; ඉඩම් පරිමානය: වත්ත ඇතුලේ ස්ථිර ගොඩනැගිලි එකක් හා වැසිකිළි එකක්, වැසිකිළි වලවල් දෙකක්, ළිඳක්**;** හිමිකම් පාන්නා: අප්පයියා ගුණරත්නම්, බිරිඳ උදයකලා; ප්‍රමාණයඃ හෙක්ටයාර් 0.3302.

ඉහත සඳහන් ඉඩම/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාට තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2018.09.19 වැනි දින අ.හා. උදේ 10.00ට උඩුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මා සම්මුඛ විය යුතුයි.

තවද, 2018.09.10 වැනි දින මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවන් එකී ඉඩම්/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තර වන්දි මුදල් හා ඒ මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සිවරාජසින්ගම් ජෙයකාන්ත්,
ප්‍රාදේශීය ලේකම්,
වලිකාමම් දකුණ, උඩුවිල්.

2018 අගෝස්තු මස 6 වැනි දින
උඩුවිල්,
ප්‍රාදේශීයලේකම් කාර්යාලයේ දී.

08-802

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.